**රත්නපුර මහා නගර සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**-----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 18 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මෝටර් රථ හා කරත්ත ගිණුමේ ආරම්භක ශේෂය රු. 550,000 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට දේපල, පිරියත හා උපකරණ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු පිරිවැය රු. 917,196 ක් වූ ස්ථාවර වත්කම් රු. 1,067,728 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් ශේෂය රු. 150,532 කින් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කර තිබූ කර්මාන්ත 03 ක් සඳහා ගෙවිය යුතු එකතුව රු. 647,480 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම හා 2017 දෙසැම්බර් 31 දිනට ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව 2018 වර්ෂයේදී ගෙවීම් කර තිබුණු එකතුව රු. 86,065 ක් සඳහා ණයහිමි වෙන්කිරීම් සිදුකර නොතිබීම හේතුවෙන් ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු එකතුව රු. 279,500 ක් වූ වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) 2017 නොවැම්බර් ලැබී තිබූ තානායම් කුලී ආදායම් තුල ඇතුලත් එකතුකල අගය මත බදු රු. 489,796 ක් කුලී ආදායම් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයට අදාල තානායම් කුලිය රු. 116,693 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු හිඟ තානායම් කුලිය රු. 4,803,635 ක් වුවත්, එම වටිනාකම රු. 7,069,859 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ණයගැතියෝ රු. 2,266,224 ක් වැඩියෙන් දැක්වුණි.

(ඌ) ආදායම් එකතුකිරීමේ විශේෂ ගිණුමට බැර කර තිබූ වරිපනම් ගාස්තු රු. 2,318,936 ක් ආදායම් ගිණුමට මාරුකිරීම දෙවරක් සටහන් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණු අතර, ආදායම් එකතුකිරීමේ විශේෂ ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුල ප්‍රධාන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු එකතුව රු. 12,558,150 ක් වූ ට්‍රැක්ටර් 05 ක්, ට්‍රේලර් 05 ක් හා ත්‍රීරෝද රථයක් ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, පළාත් සමාජ සුභසාධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු මහන මැෂින් 05 ක වටිනාකම හඳුනාගෙන ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයට අදාල දැන්වීම් පුවරු ගාස්තු රු. 482,900 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඔ) සභාවට අයත් සිනමා ශාලාව සඳහා සමාලෝචිත වර්ෂයට අදාල බිල්කල ආදායම රු. 680,000 ක් වුවද, එය රු. 136,000 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මෙහෙයුම් ආදායම රු. 544,000 ක් අඩුවෙන් දැක්වුණි. එමෙන්ම හිඟ කුලිය මත ගණනය කර තිබූ රු. 136,000 ක දඩ මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) ඉහත (ඔ) ඡේදයේ සඳහන් සිනමා ශාලාව සඳහා පූර්ව බදුකරුගෙන් හා වර්තමාන බදුකරුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු. 2,633,000 ක් වුවද, එය රු. 551,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ණයගැතියෝ රු. 2,082,000 කින් අඩුවෙන් දැක්වුණි.

(ක) ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබූ කර්මාන්ත 02 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුල ගෙවීම් කිරීමේදී එකතුව රු. 1,217,915 ක් ණයහිමි ගිණුමට හර කර තිබීම හේතුවෙන් ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ග) සමාලෝචිත වර්ෂයට අදාල හිඟ ව්‍යාපාර බදු රු. 430,800 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ජංගම ගිණුම් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා සාරාංශ මුදල් පොත් අනුව ශේෂ අතර එකතුව රු. 8,297,141 ක වෙනසක් පැවතුණි.

(ආ) සභාව විසින් පවත්වා ගෙනයන සාරාංශ මුදල් පොත් අනුව 2017 දෙසැම්බර් 31 දිනට අතැති මුදල් ශේෂය රු. 1,173,653 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු. 663,180 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 510,473 ක වෙනසක් පැවතුණි.

(ඇ) තැන්පත් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ තැන්පත් ශේෂයන් අතර එකතුව රු. 29,554,297 ක වෙනසක් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ එකතු කල අගය මත බදු ලැබීම් හා ගෙවීම් සහ පොදු ලෙජරයේ එම ගිණුම අතර රු. 1,038,842 ක වෙනසක් පැවතුණි.

(ඉ) ආදායම් විෂයයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ ආදායම් සහ ආදායම් ලේඛන අතර රු. 4,795,646 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම්

--------------------

දීර්ඝ කාලයක සිට අයවීම් හිඟහිට ඇති සබරගමුව බස් සමාගමෙන් අයවිය යුතු රු. 2,300,000 ක් සමාලෝචිත වර්ෂය තුලදීද අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි.

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

--------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 402,962,895 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 අනුකූල නොවීම්

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

--------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 122 වගන්තිය | නගරය තුල ඇති ගෙවල් හා ගොඩනැගිලි යථෝක්ත පනත යටතේ හෝ වෙනයම් ප්‍රඥප්තියක විධිවිධාන වලින් නියමිත අන්දමේ සනීපාරක්ෂක තත්ත්වයක පවත්වාගෙන යන බව සැකහැර දැන ගැනීමේ අදහසින් නගරයේ සෑම කොටසකම කලින් කල පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගෙන නොතිබූ අතර, ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධයෙන් |

| | |
|---|---|
| | අනුමැතිය ලබා දීමේදී පමණක් අදාල පරීක්ෂණය සිදුකර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 571 | 2001 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල එකතුව රු. 6,984,940 ක් වූ ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය 2018 මැයි 31 දින වනවිටත් සිදුකර නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | |
| (i) 03 ඡේදය | අපහරණය කලයුතු වාහන හඳුනාගැනීම සඳහා සුදුසුකම්ලත් සාමාජිකයින්ගෙන් සමන්විත විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත් නොකර සභාවේ වාහන පාලක විසින් අපහරණය කලයුතු වාහන හඳුනාගෙන තිබුණි. |
| (ii) 05 ඡේදය | අපහරණය කරන වාහන තක්සේරු කිරීම සඳහා අනිවාර්යයෙන් සිටිය යුතුයැයි නම් කරන ලද නිලධාරීන් තිදෙනෙකු ඇතුලත් මණ්ඩලයක් පත් නොකර සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (යාන්ත්‍රික) මඟින් ලබාදුන් තක්සේරු මිල මත පදනම්ව වාහන 08 ක් වෙන්දේසි කර තිබුණි. |
| (ඈ) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ආයතන ප්‍රධානියා සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් සුදුසුකම් පරීක්ෂා කර සනාථ කර ගැනීමෙන් තොරව සමිතියේ ඉල්ලීම් ලිපිය හා එම සමිතිය ලියාපදිංචි ආයතනයේ හැකියා සහතිකය පමණක් පදනම් කරගෙන ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු. 5,518,635 ක් වූ කොන්ත්‍රාත් 07 ක් ප්‍රදානය කර තිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය 1.5 ඡේදය | යටත් පිරිසෙයින් වර්ෂ 05 කට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කලයුතු වුවත්, රත්නපුර පොදු වෙළඳපල කඩකාමර සඳහා වර්ෂ 20 ක සිට බදු කුලිය සංශෝධනය කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 90,472,449 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 71,376,984 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

-----------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 32,000,000 | 31,088,136 | 30,494,091 | 26,806,840 | 36,500,000 | 34,424,023 | 31,632,960 | 29,504,918 |
| හා බදු කුලී | 63,165,069 | 70,584,039 | 66,602,133 | 27,986,516 | 62,995,894 | 54,058,601 | 48,522,467 | 24,410,254 |
| බලපත්‍ර ගාස්තු | 5,997,100 | 2,424,403 | 2,424,403 | - | 6,092,300 | 1,844,884 | 1,844,884 | - |
| වෙනත් ආදායම් | 74,524,800 | 64,260,941 | 64,370,364 | 18,342,730 | 69,429,300 | 63,275,448 | 47,530,588 | 22,133,056 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බදුකුලී හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 12 කින් හා 03 කින් වැඩි වී තිබූ අතර වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 05 කින්, 60 කින්, 25 කින්, 74 කින් හා 15 කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 26,674,986 ක් වූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි. එමෙන්ම හිඟ වරිපනම් ශේෂය පිළිබඳ කාල විශ්ලේෂණයක් ලබා දීමට සභාව අපොහොසත් විය.

(ආ) වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කලයුතු වුවද, 1997 වර්ෂයේ වරිපනම් තක්සේරුව අනුව වරිපනම් අය කරමින් පැවතුණි. 2005 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව ක්‍රියාත්මක කිරීම මහා සභාව සහ මුදල් කාරක සභාව විසින් අවස්ථා දෙකකදී ප්‍රමාද කර තිබූ නමුත් 2018 මැයි වනවිටත් නව තක්සේරුවක් සිදුකර නොතිබුණි.

### 2.2.4 කුළී

-----

(අ) නාගරික කොමසාරිස්ගේ 2017 අගෝස්තු 09 දිනැති ලිපිය මඟින් රත්නපුර නගරයේ පල්ලිය පාරේ, පදිකයින්ට, රථ වාහන වලට හා කාණු පද්ධතියට බාධාවක්ව පවතින සියළු ස්ථිර හා තාවකාලික ඉදිකිරීම් හා පදික වෙළඳාම් 2017 අගෝස්තු 30 දිනට පෙර ඉවත් කර ගන්නා ලෙස දැනුම් දී තිබූ අතර, එම ලිපියේ දින සිට එම මාර්ගයේ වෙළඳාම් කරන පදික වෙළඳුන්ගෙන් ගාස්තු අය කිරීමද අත්හිටුවා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2018 මැයි 31 දින වනවිටත් අදාල ඉදිකිරීම් හා පදික වෙළඳාම් කිසිවක් ඉවත් කරගෙන නොතිබුණු නමුත් මහා නගර සහා ආඥා පනතේ 77 වගන්තිය ප්‍රකාරව එම ඉදිකිරීම් ඉවත් කර අලාභ අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ii) පදික වෙළඳාම් හේතුවෙන් ඇතිව තිබූ අවහිරතා කිසිවක් ඉවත්ව නොතිබුණද, අදාල මාර්ගයේ පදික වෙළඳුන්ගෙන් දිනකට එකතුවන රු. 5,000 ක පමණ ආදායම සභාවට අහිමි වී තිබුණි.

2017 අගෝස්තු සිට 2018 මැයි දක්වා කාලපරිච්ඡේදයට අදාලව එසේ අහිමි වී තිබූ ආදායම් එකතුව දල වශයෙන් රු. 1,250,000 ක් පමණ විය.

(ආ) රත්නපුර නගරයේ පිහිටි සභාව සතු සිනමා ශාලාව 2001 මැයි 01 දින සිට 2010 අප්‍රේල් දක්වා පවත්වාගෙන ගොස් තිබූ බදුකරුගෙන් අයවිය යුතු රු. 1,953,000 ක හිඟ බදු මුදල අයකර ගැනීමට හෝ බදුකරුට එරෙහිව නීතිමය පියවර ගැනීමට 2018 මැයි වනවිටත් සභාව කටයුතු කර නොතිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

**---------------**

සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු එකතුව රු. 430,800 ක් වූ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට සභාව අපොහොසත්ව තිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,535,848 ක් හා මුද්දර ගාස්තු රු. 15,028,546 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යසාධනය**

**-----------------**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

**-------------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම**

**-----------------------------------------------------**

මුදල් කොමිෂන් සභා ලේකම්ගේ 2015 අප්‍රේල් 30 දිනැති ලිපිය මඟින් මහා නගර සභා වල ධාරිතා සංවර්ධනය සඳහා 2015 වර්ෂය වෙනුවෙන් සෑම පළාතක් සඳහාම රුපියල් මිලියනයක් බැගින් ප්‍රතිපාදන

ලබාදී තිබූ අතර, එක් එක් මහා නගර සභාව විසින් එකී ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක කල යුතු ධාරිතා සංවර්ධන වැඩසටහන්ද නම් කර තිබුණි. ඒ අනුව, රත්නපුර මහා නගර සභාව විසින් අන්තර්ජාල පහසුකම් මගින් ගෙවීම් කටයුතු පහසු කරලීම හා මහජන පැමිණිලි පිළිබඳ අප්‍රමාදව සොයා බැලීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කලයුතු වූ අතර, ඒ සඳහා රු. 1,795,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධතියක් 2016 දෙසැම්බර් මස සපයා ගෙන තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) ලංසු ඇගයීමේදී පූර්වයෙන් පිළියෙල කර තිබූ පිරිවිතර සමඟ ලැබී තිබුණු ලංසු ඇගයීම් කිරීමෙන් තොරව ප්‍රසම්පාදනය පිරිනමන ලද ආයතනය ඉදිරිපත් කර තිබූ මෘදුකාංග පද්ධතියේ පවතින පිරිවිතර පදනම් කරගනිමින් සියළුම ලංසු ඇගයීම් කර තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදනයට සහභාගී වූ සෙසු පාර්ශවයන්ට සාධාරණය ඉෂ්ඨ වී නොතිබුණු අතර, මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු දෙකෙන් එකක් වූ "මහජන පැමිණිලි පිළිබඳ අප්‍රමාදව සොයා බැලීම" සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ii) මිලදී ගෙන තිබූ මෘදුකාංග පද්ධතියෙහි ඇතුලත් වරිපනම් කළමනාකරණ පද්ධතිය 2018 පෙබරවාරි සිට ස්ථාපිත කර තිබුණද, මිශ්‍ර ආදායම්, පුස්තකාල කළමනාකරණ හා අන්තර්ජාල ගෙවීම් පහසුකම් පද්ධති 2018 මැයි වනවිටත් ස්ථාපිත කර නොතිබුණි. එමෙන්ම සැපයුම්කරු විසින් නොමිලයේ සපයන බවට එකඟ වී තිබූ වෙබ් අඩවිය හා ජල කළමනාකරණ පද්ධතියද ස්ථාපිත කර නොතිබුණි.

**(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

**-------------------------------------------------**

අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන සලසා දී තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු. 62,320,000 ක් වූ කර්මාන්ත 23 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නගරයේ පොදු වෙළඳපල හා හෝටල් වලින් ඉවත් කරන එළවළු ද්‍රව්‍ය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 04 කින් වර්ග කර එකතු කරනු ලබන දිරන කසළ යොදාගෙන කොම්පෝස්ට් පොහොර නිපදවීම සිදුකරනු ලැබුවද, ග්‍රාම නිලධාරී කොට්ඨාශ 05 ක නිවෙස් වලින් එකතු කරන කසළමලු කිසිඳු වෙන්කිරීමකින් තොරව බැවුම් සහිත විවෘත භූමියට බැහැර කිරීම සිදුකර තිබුණි. එම තත්ත්වය නිසා පාරිසරික හා සාමාජීය වශයෙන් විශාල ගැටළුසහගත තත්ත්වයක් ඇතිවිය හැකිව තිබුණි.

(ii) ඇස්තමේන්තුගත පිරිවැය රු. 2,653,288 ක් වූ කණාදොළ කසළ බැහැර කරන ප්‍රදේශයේ විසිරී ඇති කුණු වසා දැමීමේ කර්මාන්තයේ I අදියර සඳහා 2017 අගෝස්තු 09 දින පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලැබී තිබුණද, 2018 මැයි වනවිටත් එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(iii) කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් 2016 වර්ෂයේදී ලැබී තිබුණු යන්ත්‍රෝපකරණ 03 ක් නිෂ්කාර්යයව පැවති අතර, එම ව්‍යාපෘතියට අදාල ගොඩනැගිලි ඉදිකර තිබුණද, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

**(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක**

**-----------------------------**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) තානායම් කුලී**

**----------------**

(i) නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය යටතේ රත්නපුර මහා නගර සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන ලද බස් නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1204 ශ්‍රී (එස්එෆ්) යටතේ රු. 54,566,853 ක ණය මුදලක් ලබා දී තිබුණි. නාගරික සංවර්ධන අධිකාරී අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 29/06/24 හා 2006 අගෝස්තු 31 දිනැති ලිපිය ප්‍රකාරව රත්නපුර මහා නගර සභාවට තානායම් කුලී ලෙස ගෙවිය යුතු මුදලින් සියයට 50 ක් 2004 ජූලි සිට යථෝක්ත ණය මුදලට හිලව් කර ගන්නා බව දක්වා තිබුණද, එසේ හිලව් කර තිබූ වටිනාකම හඳුනාගෙන නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය වනවිටත් සම්පූර්ණ ණය මුදල වගකීමක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ii) 2013 සැප්තැම්බර් සිට 2017 සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව තානායම් කුලී ලෙස රු. 4,442,452 ක් 2017 නොවැම්බර් මාසයේදී ලැබී තිබුණි. එහෙත් 2012 මාර්තු 01 දිනැති ගිවිසුම ප්‍රකාරව එම කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතු තානායම් කුලිය රු. 4,598,573 ක් වූයෙන් රු. 156,121 ක් අඩුවෙන් ලැබීම පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

(iii) 2009 වර්ෂයේ සිට 2013 අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු එකතුව රු. 4,366,496 ක් වූ තානායම් කුලී සභාව වෙත අයවී නොතිබූ අතර, අදාල මුදල් නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අයකර ගැනීමට හෝ එම ආයතනය වෙත ගෙවිය යුතු ණය මුදලට හිලව් කරගෙන තිබේද යන බව තහවුරු කර ගැනීමට හෝ සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) ආසියානු සංවර්ධන බැංකු ණය ව්‍යාපෘතිය - 1632 ශ්‍රී (එස්එෆ්) යටතේ ක්‍රියාත්මක කර තිබූ නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය මඟින් රත්නපුර වෙරළුප පාර 2005 වර්ෂයේදී සංවර්ධනය කර තිබූ අතර, ඒ සඳහා සභාව විසින් ගෙවිය යුතුව තිබූ ණය මුදල රු. 12,656,450 ක් විය. යථෝක්ත මාර්ගය නිසි පරිදි සංවර්ධනය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වනවිටත් මාර්ගය සභාව වෙත පවරා ගෙන නොතිබුණු අතර, ණය මුදල ගෙවීමටද කටයුතු කර නොතිබුණි. සම්පූර්ණ ණය මුදල දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනවිත් තිබුණු නමුත් ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා සභාව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය තුල පැවති වාහන වෙන්දේසියේදී වාහන මිලදී ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණු ගැනුම්කරුවන් පස්දෙනෙකු මුදල් ගෙවා එම වාහන රැගෙන ගොස් නොතිබුණි. අදාල ගැනුම්කරුවන් වෙත සිහිකැඳවීම් ලිපි යවා තිබුණ ද ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) පසුගිය වර්ෂයේදී හඳුනාගෙන තිබූ එකතුව රු. 18,384,712 ක් වූ ගිණුම්කරණ දෝෂ 09 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිවැරදි කර නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම සඳහා විධිමත් වැඩසටහනක් සභාව සතු නොවූ අතර, ලැබෙන පෙත්සම් මත පමණක් අනවසර ඉදිකිරීම් හඳුනාගැනීම සිදුව තිබුණි. එම තත්ත්වය මත අනවසර ඉදිකිරීම් තවදුරටත් වර්ධනය වීමේ අවදානමක් පැවතුණි. අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි වේ.

(i) රත්නපුර, දෙමුවාවත, නගර සභා පෙදෙසෙහි පිහිටි සිව්මහල් ගොඩනැගිල්ලක් සඳහා 2011 සැප්තැම්බර් 08 දින අනවසර නිවේදනයක් යවා තිබුණද, ගොඩනැගිල්ල ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ අතර 2012 මැයි 09 දිනැති රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ අධ්‍යක්ෂගේ ලිපිය අනුව එම ගොඩනැගිල්ල සඳහා සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස අදාල පාර්ශවය වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2012 ජුලි 17 දින එම ගොඩනැගිල්ලට අදාල අයදුම්පත සභාව වෙත ලැබී තිබුණද, ගොඩනැගිල්ල නියමිත පිරිවිතර වලට අනුකූල නොවූයෙන් සැලැස්ම අනුමත කල නොහැකිව තිබුණි. 2018 මැයි වන විටත් අදාල ගොඩනැගිල්ල ඉවත් කිරීමට සභාව පියවර ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුල ලැබී තිබූ පැමිණිළි මත හඳුනාගෙන තිබුණු අනවසර ඉදිකිරීම් 11 ක් ඉවත් කරගන්නා ලෙස ලිඛිත දැනුම්දීම් සිදුකර තිබුණ ද ඊට ප්‍රතිචාර දක්වා නොතිබුණු අනවසර ඉදිකිරීම් 09 ක් ඉවත් කිරීමට සභාව පියවර ගෙන නොතිබුණි.

(iii) තාප්පයක් ඉදිකිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ගොඩනැගිලි අයදුම්පතකට සභාවේ අනුමැතිය ලැබී නොතිබියදී, වීථියට අතහැරිය යුතු භූමි සීමාව ද උල්ලංඝනය කරමින් අදාළ තාප්පය ඉදිකර තිබූ නමුත් සභාව ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවට අයත් එකතුව අක්කර 06 රූඩ් 01 පර්චස් 02 ක් වූ ඉඩම් ඒකක 71 ක් හා ප්‍රමාණය හඳුනාගෙන නොතිබූ ඉඩම් ඒකක 98 ක් බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන ඇති බව හඳුනාගෙන තිබුණ ද එම දේපළ ආපසු පවරා ගැනීමට හෝ නියමානුකූල කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) 2017 වර්ෂයට අදාල මුද්දර ගාස්තු හා උසාවි දඩ ආදායම හඳුනාගෙන නොතිබුණු අතර, එකතුව රු. 22,000,000 ක් වූ ඇස්තමේන්තුගත වටිනාකම් ගිණුම්ගත කර තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු වැන් රථයක බඳ සම්පූර්ණයෙන්ම දිරාපත්වීම, ආසන සියල්ල හා වායුසමීකරණ පද්ධතිය අළුත්වැඩියා තත්ත්වයේ පැවතීම හා රිම් සෙට් එක සම්පූර්ණයෙන්ම දිරාපත්වීම යන අඩුපාඩු හේතුවෙන් වරක් පාවිච්චි කරන ලද (Recondition) බඳක් තබා රථය අළුත්වැඩියා කිරීම සඳහා 2016 වර්ෂයේදී ප්‍රසම්පාදන කැඳවා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

   (i) මිල කැඳවීමේ ලිපි ආයතන 05 කට යවා තිබුණ ද ඉන් ආයතන දෙකක් ව්‍යාජ ආයතන විය. සෙසු ආයතන තුනෙන් 02 ක් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය අත්තිකාරම් ඉල්ලා තිබීම හා අළුත්වැඩියා කටයුතු පරීක්ෂා කර බැලීමේ පහසුව සලකා රත්නපුර ප්‍රදේශයෙන් මිල ගණන් කැඳවා තිබූ එකම ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

   (ii) සභාව විසින් 2016 ඔක්තෝබර් 20 දින වැන් රථය අළුත්වැඩියාව සඳහා භාරදී තිබුණි. පසුව නාගරික කොමසාරිස්ගේ 2016 ඔක්තෝබර් 23 දිනැති ලිපිය මඟින් නැවත දැනුම්දෙන තුරු අළුත්වැඩියා කටයුතු තාවකාලිකව නවත්වන ලෙස දන්වා තිබූ අතර 2017 අප්‍රේල් 20 දිනැති ලිපිය මඟින් අළුත්වැඩියා කටයුතු නැවත ආරම්භ කරන ලෙස එම ආයතනය දැනුවත් කර තිබුණි. කෙසේ වුවද, අළුත්වැඩියාවකින් තොරව මාස 16 කට අධික කාලයක් අදාල ගරාජයේ ගාල් කර තිබුණු රථය 2018 මාර්තු 02 දින නැවත සභාව වෙත රැගෙන විත් තිබූ අතර, 2018 ජූනි වනවිටත් අළුත්වැඩියාව සඳහා යොමු කිරීමකින් හෝ අපහරණය කිරීමකින් තොරව දිරාපත්වෙමින් පැවතුණි.

(ආ) 2004 ජූලි 28 දින මිලදී ගෙන තිබුණු ත්‍රීරෝද රථයක වයිපර් සහ තට්ටුව සම්පූර්ණයෙන්ම දිරාපත්වීම, වහලයේ සම්පූර්ණ කැන්වස් රෙද්ද අළුතින් දැමිය යුතු වීම හා සීට් සම්පූර්ණයෙන්ම අළුතින් දැමිය යුතුවීම යන අඩුපාඩු හේතුවෙන් රථය අළුත්වැඩියා කලයුතු බව රථයේ රියදුරු විසින් 2016 ජූලි 07 දිනැති ලිපිය මඟින් දන්වා තිබූ අතර, සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ දිසා යාන්ත්‍රික ඉංජිනේරු විසින් අබලි ද්‍රව්‍ය අපහරණය කරන ක්‍රමය යටතේ එම රථය අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. පසුව එම රථය වෙන්දේසි කිරීමට සභාව තීරණය කර තිබූ අතර, දිසා යාන්ත්‍රික ඉංජිනේරු විසින් ත්‍රීරෝද රථය රු. 125,000 කට තක්සේරු කර තිබුණි. එහෙත් 2017 අගෝස්තු 31 දින සිදුකල භෞතික පරීක්ෂාවට අනුව ත්‍රීරෝද රථයේ තට්ටුව සම්පූර්ණයෙන්ම දිරාපත්වීම යන්න සාවද්‍ය බව නිරීක්ෂණය විය. ක්‍රියාකාරී තත්ත්වයේ පවතින ත්‍රීරෝද රථය 2018 ජූනි වනවිටත් අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීමෙන් තොරව සභාවට අයත් ගබඩාවෙහි ගාල්කර තිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

-----------------------------

### 3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

-------------------------------------------

1992 වර්ෂයේදී යුනිසෙෆ් (UNICEF) ආධාර යටතේ ලැබී තිබුණු කැබ් රථයක් 2004 ඔක්තෝබර් 03 දින අනතුරකට ලක්වී තිබුණු අතර, එහිදී එංජිම පුපුරා යාමෙන් රථයට විශාල වශයෙන් අලාභහානී සිදුවී තිබුණි. අනතුරින් පසුව රථය අළුත්වැඩියා කර නොතිබුණු අතර 2016 සැප්තැම්බර් 09 දින වෙන්දේසි කර තිබුණි. පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) 1951 අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ 37(3) උප වගන්තිය ප්‍රකාරව ලබා ගතයුතු අභාවිත සහතිකය ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් 2008 ජනවාරි 01 දින සිට 2016 අගෝස්තු 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු වශයෙන් රු. 75,384 ක් ගෙවීම් කර තිබුණි.

(ආ) කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2004 වර්ෂයේදී භාරදී තිබූ අතර, අමතර කොටස් සඳහා වැයවන රු. 500,000 ට අමතරව රු. 96,150 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. 2005 මාර්තු 22 දින රක්ෂණාවරණය මඟින් රු. 125,037 ක් ලබාදී තිබූ අතර, ඉතිරිය අළුත්වැඩියාවට අදාල බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව ගෙවීම් කරනු ලබන බව දන්වා තිබුණි. ඒ අනුව රක්ෂණාවරණය මඟින් වියදම් ප්‍රතිපූරණය කරගැනීමේ හැකියාව පැවතියදීත් රථය අළුත්වැඩියා කිරීමට පියවර ගෙන නොතිබූ අතර වසර දෙකකට අධික කාලයක් එම ගරාජය තුල අනාරක්ෂිත ලෙස ගාල්කර තිබුණි.

(ඇ) 2007 අප්‍රේල් 30 දිනැති අංක 3(20) දරන සභා තීරණය මඟින් ද කැබ් රථය අළුත්වැඩියා කල යුතු බවට තීරණය කර තිබූ අතර 2010 පෙබරවාරි 05 දිනැති රත්නපුර ඩිපෝ ඉන්ජිනේරුගේ ලිපිය මඟින් ද රථය අළුත්වැඩියා කල යුතු බවට නිර්දේශ කර තිබුණි. එහෙත් එකී නිර්දේශ නොසලකා හරිමින් වසර 10 ක් පමණ නගර සභා අංගනය තුල ගාල්කර තිබූ කැබ් රථය 2016 සැප්තැම්බර් 09 දින රු. 1,145,000 කට වෙන්දේසි කර තිබුණි.

(ඇ) අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අංක 104(4) ප්‍රකාරව සිදුකර තිබූ පරීක්ෂණයේ අවසන් වාර්තාව අනුව රියදුරු වරදකරු කර තිබුණද, ඔහු සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර අලාභ අයකරගෙන නොතිබුණි.

### 3.5.2 නිෂ්ක්‍රීය වත්කම්

--------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 ජනවාරි 26 දින රු. 320,000 ක් වැයකර කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 02 ක් මිලදී ගෙන තිබූ අතර, ඉන් එක් යන්ත්‍රයක් මිලදී ගත් වර්ෂයේ සිට ද අනෙක් යන්ත්‍රය වර්ෂ 02 කට අධික කාලයක සිටද භාවිතා කළ නොහැකිව අක්‍රීයව පැවතුණි.

(ආ) වාහන සේදීමේ කටයුතු සඳහා සභාව විසින් 2016 ජූලි 15 දින රු. 335,000 ක් වැය දරා වාහන සේදීමේ යන්ත්‍රයක් (Service Machine) මිලදී ගෙන තිබුණද, වසර දෙකකට ආසන්න කාලයක් එම යන්ත්‍රය නිෂ්කාර්යයව පැවතුණි. 2018 මැයි මස යන්ත්‍රය උපයෝජනයට ගෙන තිබුණද, දින කිහිපයක් තුල අක්‍රීය වී තිබූ නමුත් 2018 ජූනි 18 දින වනවිටත් අළුත්වැඩියා කර නොතිබුණි.

### 3.6 හඳුනාගත් අලාභ

-------------------

සභාවේ හිටපු වැඩ අධිකාරීවරයකු විසින් 2013 මැයි 28 දින සිට භාවිතා කර තිබුණු යතුරුපැදියක් 2016 පෙබරවාරි 02 දින අනතුරට පත්වී තිබුණ ද ඒ පිළිබද සභාව දැනුවත් කර නොතිබුණි. පසුව සභාවේ අනුමැතියකින් ද තොරව යතුරුපැදිය අළුත්වැඩියාව සඳහා ගරාජයක් වෙත යොමුකර තිබුණු අතර, එහි ගාල්කර තිබියදී 2016 ඔක්තෝබර් 18 දින පෞද්ගලික ආයතනයකට අයත් ලොරියක ගැටී නැවත අනතුරට පත්ව තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) දෙවන අනතුරින් පසුව සිදුකල යුතු සියළු අළුත්වැඩියා සම්බන්ධයෙන් රු. 108,750 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. අනතුර සිදු වූ දිනය වනවිට රක්ෂණ ඔප්පුව අවලංගු වී තිබීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවිය නොහැකි බව රක්ෂණ සමාගම දැනුම් දී තිබුණි. එහෙත් 2016 මැයි 31 දින සිට 2017 මැයි 30 දින දක්වා කාලසීමාව වෙනුවෙන් රක්ෂණාවරණය අලුත් කිරීමේ ගාස්තු වශයෙන් රු. 11,407 ක් 2016 මැයි 26 දින ගෙවීම් කර තිබියදී රක්ෂණාවරණය අවලංගු වී තිබීමට හේතු වූ කරුණු පිළිබදව රක්ෂණ සමාගමෙන් විමසීම් කර නොතිබුණි.

(ආ) සිදුවී තිබූ දෙවන අනතුර ලොරියේ රියදුරුගේ වරදින් සිදුවී තිබුණ ද ඔහුගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) යතුරු පැදිය භාවිතා කල නිලධාරියා 2016 ඔක්තෝබර් 15 දින විශ්‍රාම ගොස් තිබුණ ද ඔහු භාරයේ තිබූ යතුරු පැදිය විධිමත්ව භාර දී නොතිබුණි. එහෙත් ඒ පිළිබද නොසලකාහැර ඔහුට හිමි විශ්‍රාම ප්‍රතිලාභ 2018 ජනවාරි 16 දින ගෙවීම් කර තිබුණි.

(ඇ) නාගරික කොමසාරිස්ගේ නියෝගය අනුව සභාවේ අභ්‍යන්තර විගණන නිලධාරී විසින් සිදුකර තිබූ 2017 සැප්තැම්බර් 18 දිනැති විමර්ශන වාර්තාව මගින් යතුරු පැදිය භාවිතා කළ නිලධාරියා සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර සිදුව ඇති අලාභය අයකර ගැනීම නිර්දේශ කර තිබුණ ද 2018 මැයි වනවිටත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 2018 ජූනි වනවිටත් අදාල යතුරුපැදිය කිසිඳු අළුත්වැඩියාවකින් තොරව නගර සභා ගබඩාව තුල ගාල්කර තිබුණි.

## 3.7 ප්‍රසම්පාදනය

---------------

### 3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.7.2 සැපයීම් හා සේවා

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 02 කදී රු 821,560 ක් වැයකර සභාවේ වාහන සඳහා අවශ්‍ය ටයර් හා ටියුබ් මිලදී ගෙන තිබූ අතර ඊට අදාලව ප්‍රසම්පාදන කැඳවීම, ඇගයීම හා ප්‍රසම්පාදන පිරිනැමීමේදී සිදුව තිබූ දෝෂ හේතුවෙන් සභා අරමුදලට රු. 88,204 ක පාඩුවක් සිදුව තිබුණි.

(ආ) එකතු කල අගය මත බදු (VAT) ඉන්වොයිසියක් ඉදිරිපත් කර නොමැති කිසිඳු සැපයුමක් සඳහා එකතු කල අගය මත බදු ගෙවීම් නොකල යුතු වුවද, සභාව සඳහා ටයර් මිලදී ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ VAT ලියාපදිංචි අංකය රහිත ඉන්වොයිසියේ සඳහන් සම්පූර්ණ වටිනාකම (බදු සහිත) ගෙවීම් කර තිබීම හේතුවෙන් රු. 70,834 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල රු. 308,000 ක් වැයකර සභාව සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. ඊට අදාල ලංසු ඇගයීමේ දී සිදුවී තිබූ දෝෂ හේතුවෙන් අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර වැඩිම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබූ අතර, භාණ්ඩ ලැබීමෙන් පසු පිරිවිතර වලට අනුකූල නොවන බව පවසා යන්ත්‍රය ආපසු රැගෙන යන ලෙස අදාල ආයතනය වෙත දන්වා තිබුණි. 2018 ජූනි වනවිටත් යන්ත්‍රය ආපසු රැගෙන ගොස් නොතිබූ අතර, සභාවේ අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා වෙනත් යන්ත්‍රයක් මිලදී ගැනීමටද කටයුතු කර නොතිබුණි.

### 3.7.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇස්තමේන්තුගත පිරිවැය රු. 1,106,504 ක් වූ මහවලවත්ත පළමු හරස් පාර බෝක්කුව සමඟ කොන්ක්‍රීට් කිරීම සඳහා 2017 නොවැම්බර් 16 දින ගිවිසුම් අත්සන් කර තිබුණු අතර, මාසයක් තුල කර්මාන්තය අවසන් කල යුතු විය. එහෙත් 2018 ජූනි වනවිටත් එහි වැඩ ආරම්භ කර හෝ නොතිබුණි.

(ආ) ගංවතුර හා නායයාම හේතුවෙන් හානියට පත් මාර්ග පුනරුත්ථාපනය හා ඉදිකිරීමේ වැඩසටහන යටතේ මිහිඳුගම අත්කම් නිවාස පාරේ පැති බැම්මක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා 2017 ඔක්තෝබර් 09 දින රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් රු. 1,066,987 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි.
පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) රත්නපුර ප්‍රාදේශීය ලේකම්වරිය සහ නාගරික කොමසාරිස් විසින් 2017 ඔක්තෝබර් 11 දින අත්සන් කරන ලද ගිවිසුම ප්‍රකාරව 2017 නොවැම්බර් 25 දිනට පෙර කර්මාන්තයේ වැඩ නිමකල යුතුව පැවතුණි. එහෙත් තෝරාගෙන තිබූ ගොවි සංවිධානය වෙත කොන්ත්‍රාත්තුව පැවරීම 2017 නොවැම්බර් 16 දින තෙක් ප්‍රමාද වී තිබුණි.

(ii) 2018 පෙබරවාරි 28 දින වනවිටත් කර්මාන්තය අවසන් කර නොතිබුණද, කොන්ත්‍රාත්කරු විසින් දින දීර්ඝ කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් ගිවිසුමේ 4 වගන්තිය ප්‍රකාරව 2018 පෙබරවාරි 28 දින වනවිට රු. 20,843 ක් ප්‍රමාද ගාස්තු වශයෙන් අය කල යුතුව පැවතුණි.

(iii) රත්නපුර ප්‍රාදේශීය ලේකම්ගේ 2017 දෙසැම්බර් 08 දිනැති ලිපිය අනුව 2017 දෙසැම්බර් 15 දින දක්වා පමණක් දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණු අතර, ඉන් ඉදිරියට දින දීර්ඝ නොකරන බව දැනුම් දී තිබුණි. ඒ අනුව, වැඩ අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රතිපාදිත මුදල් නොලැබී යාමේ අවදානමක් පැවතුණි.

(ඇ) ඇස්තමේන්තුගත වටිනාකම රු. 1,168,527 ක් වූ මුවගමකන්ද විවේකාරාම පන්සල අසල පැති බැම්ම ඉදිකිරීම කර්මාන්තයේ වැඩ සතුටුදායක ලෙස අවසන්ව ඇති බවට 2017 දෙසැම්බර් 22 දින කාර්මික නිලධාරී විසින් වැඩ අවසන් වාර්තාව ලබාදී තිබූ අතර ගෙවීම් බිල්පත අනුව පස් පිරවීම වෙනුවෙන් රු. 25,712 ක් ගෙවීම් කර තිබුණි. එහෙත්, 2018 පෙබරවාරි 19 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී බැම්ම හා පාර අතර පස් පුරවා නොමැති ස්ථාන නිරීක්ෂණය විය. පිරිවැය ඇස්තමේන්තුව අනුව ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා රු. 25,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, එම කාර්යය ඉටුකර නොතිබුණි.

(ඇ)(i) ගිවිසුම්ගත වටිනාකම රු. 5,598,069 ක් වූ රත්නපුර නගර ශාලාවේ පළමු මහල වැඩිදියුණු කිරීමේ කර්මාන්තයට (වායු සමනය, ටයිල් ඇතිරීම හා වැසිකිලි අළුත්වැඩියාව) අදාල ලංසු කැඳවීම 2015 වර්ෂයේදී සිදුකර තිබුණු අතර, ගිවිසුම් අත්සන් කිරීම 2016 ජූලි 04 දින සිදුකර තිබුණි. 2016 දෙසැම්බර් 25 දින දක්වා කර්මාන්තයේ දින දීර්ඝ කර තිබුණද, කොන්ත්‍රාත්කරු හා සභාව අතර ඇතිව තිබූ නොඑකඟතාවය හේතුවෙන් කර්මාන්තයේ කටයුතු අතරමඟ නතර වී තිබුණි. අදාල ගැටළුව විසඳා කර්මාන්තයේ වැඩ යළි ආරම්භ කිරීමට 2018 ජූනි වනවිටත් සභාව අපොහොසත් වී තිබුණි.

(ii) 2016 අගෝස්තු 29 දින වනවිට නගර ශාලාවේ වායු සමීකරණ යන්ත්‍ර සවිකර ඒ වෙනුවෙන් රු. 3,718,220 ක් ගෙවා තිබුණි. එසේ වුවද, වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය අනෙකුත් කටයුතු ඉටුකර නොතිබුණු අතර, 2018 ජූනි වනවිටත් එම යන්ත්‍ර නිෂ්කාර්යයව පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

**අයවැය පාලනය**

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 85 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 75,172,500 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී පැවතුණි.

(ආ) වැය විෂයයන් 33 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 37,758,380 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 80 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

## 5. පද්ධති හා පාලනය

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | ගිණුම් වලින් අත්හැරීම් තිබීම |
| | (ii) | නියමිත ආදායම් හඳුනා නොගැනීම |
| | (iii) | මූලාා ප්‍රකාශන හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| (ආ) ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) වත්කම් පාලනය | (i) | නිෂ්කාර්යය වත්කම් පැවතීම |
| | (ii) | මහා නගර සභාව සතු ඉඩම් වල අනවසර ඉදිකිරීම් පැවතීම |
| (ඈ) අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන ඉක්මවීම |
| | (ii) | ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතීම |
| (ඉ) කොන්ත්‍රාත් පරිපාලනය | | කොන්ත්‍රාත් වැඩ වල දීර්ඝ ප්‍රමාදයන් පැවතීම |